

# ගොවි ජන සේවා මධ්‍යස්ථානය

**ගොවි ජන සේවා නව පනත යටතේ ගොවි ජන සේවා මධ්‍යස්ථානවලට පුළුල් බල තල ලැබී ඇත. මේ බලතල ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ අංශ බොහොමයක් කරා විහිදෙයි.**

(ගල්ගමුව ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී, ඒ. ඇස්. මැණික් කඩවර මහතා සමඟ කළ සාකච්ඡාවක් ඇසුරින් සකස් කෙරිණි.)

ගොවිජන සේවා මධ්‍යස්ථානය වනාහි ගොවි ජනතාවත්, රජයත් අතර සම්බන්ධීකරණය පවත්වා ගෙන යන, ගොවි කටයුතුවල දී එදිනෙද මූණ පාන්නට සිදු වන ප්‍රශ්න විසඳා ගැනීමට ගොවීන්ට පිහිටාධාර වන ග්‍රාමීය සංවිධානයෙකි. මුල දී කෘෂි සේවා මධ්‍යස්ථාන යනුවෙන් හඳුන්වනු ලද මෙම ආයතන ඇති කරන ලද්දේ පසුගිය රජය කාලයේ දී ය. දැනට ගොවිජන සේවා මධ්‍යස්ථාන 550 ක් පමණ රට පුරා පිහිටුවා ඇත.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 80 ක් පමණ ජීවත් වෙන්නේ ගම්වල ය. ගම්බද ජනතාව ගෙන් ඉතා වැඩි කොටසක් ගොවිතැනෙන් යැපෙන්නෝ වෙති. දැනට පිහිටුවා ඇති සංඛ්‍යාව අනුව සෑම ගම් සභා ප්‍රදේශයක් සඳහා ම පාහේ ගොවි ජන සේවා මධ්‍යස්ථානයක් බැගින් ක්‍රියාත්මක වෙයි.

### පුළුල් බලතල

වත්මන් රජය මගින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යළි පණ ගන්වා අළුතින් නීති ගත කෙරුණු ගොවිජන සේවා පනත යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථානවලට පුළුල් බලතල ලැබී ඇත. මේ බලතල වාරිමාර්ග සංවර්ධනය හා නඩත්තුව, පෝර, ගොවි උපකරණ හා කෘෂිකාර්-

මික ණය පහසුකම් සැපයීම, අඳ ගොවි අයිතිය හා කුඹුරු උරුමය සුරැකීම, කෘෂිකාර්මික ඉඩම් වගාව ආදී ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ අංශ රැසක් කරා විහිදෙයි.

ගොවිජන සේවා මධ්‍යස්ථානයක ප්‍රධානියා ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී තැන වෙයි. ඔහුට පැවරෙන වගකීම් අතුරෙන් වැදගත් ඒවා මෙසේ ය: වැව්, ඇළ වේලි, සොරොව් හා අනෙකුත් කුඩා ප්‍රමාණයේ වාරිමාර්ග පිළිබඳ පාලනය, කෘෂිකාර්මික ආරවුල් නිරවුල් කිරීම, අඳ ගොවි අයිතිය සුරැකීම, කුඹුරු ඉඩම් ක්‍රමවත්ව සැකැස්ම හා පාලනය, කුඹුරු හා ගොඩ ඉඩම් ක්‍රමවත්ව වගා කිරීම, වගා කටයුතුවල කාර්යක්ෂමතාවය පවත්වා ගැනීම සහ ගොවි ජන සේවා කමිටු වේත්, වගා නිලධාරීන් ගේ හා විද්‍යානේ වරුන් ගේත් (වගා නිලධාරී සහායකවරුන්) කටයුතු මෙහෙයවීම.

ගොවිජන සේවා කමිටු පත් කිරීමේත්, ඒවායෙහි ක්‍රියාකාරිත්වයත්, ඊට කලින් පැවැති එලදු වර්ධන කමිටුවලට වඩා සැලකිය යුතු තරමින් වෙනස් ය. එලදු වර්ධන කමිටුවල සාමාජිකයන් හැටියට ක්‍රියා කළේ කෘෂිකර්ම ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ ගොවීන් දහ දෙනෙකි. ගොවි ජන සේවා ප්‍රාදේශීය නිලධාරී තැන සාමාන්‍ය කෙනෙකු හැටියට කමිටු රැස්වීමට සහභාගි වූයේය. එලදු වර්ධන කමිටු වෙනුවට අළුතෙන් ඇති කරණ ලද ගොවි ජන සේවා කමිටුවල සාමාජික සංඛ්‍යාව 14 කි. ඔවුන් අතුරෙන් අට දෙනෙක් කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ රජයේ නිලධාරී හු වෙති. ඉතිරි හය දෙනා ගොවීන් විසින් පත් කර ගන්නා ලද විද්‍යානේවරුන් අතුරෙන් තෝරා ගනු ලැබූ අය යි. ගොවිජන සේවා කමිටුවේ විධායක බලතල සතුව ඇත්තේ ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරී තැනට ය.

ගොවිජන සේවා සෑම මධ්‍යස්ථානයකටම ගොවිජන සේවා කමිටුව බැගින් සම්බන්ධව ඇත. කමිටුවක බල ප්‍රදේශය ගම් සහා බල ප්‍රදේශය වන අතර, වගා නිලධාරියෙකු ගේ බල ප්‍රදේශය ගම් සභා ප්‍රදේශයට ඇතුළත් ග්‍රාම සේවා නිලධාරී බල ප්‍රදේශය යි.

## ගොවි සංවිධාන

ගොවිජන සේවා මධ්‍යස්ථාන කේන්ද්‍රස්ථාන හැටියට යොදා ගනිමින් ගොවීන් සංවිධානය කිරීමේ අලුත් වැඩ පිළිවෙලක්ද දූන් අත්හදා බලා ගෙනයනු ලැබේ. අත්හදා බැලීම සඳහා දූනට යොදා ගෙන ඇත්තේ ගල්ගමුව ගොවි ජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයයි. මෙම වැඩ පිළිවෙල යටතේ සුළු ගොවීන්ගේ සංවිධාන ඇති කරනු ලැබේ. මෙම සංවිධාන ඇති කරනු ලබන්නේ ගොවි ජන සේවා කමිටුවලත්, වගා නිළධාරීන්ගේ මෙන්ම, විද්‍යානේවරුන්ගේත්, ගොවි ජන සේවා මධ්‍යස්ථානවලට සම්බන්ධ රජයේ නිලධාරීන්ගේත් සහයෝගය ඇතිවය.

සුළු ගොවීන්ගේ සංවිධානවලින් මූලිකව බලාපොරොත්තු වනුයේ තනි තනිව ගොවි තැන් බත් කිරීමේ පාරම්පරික ක්‍රමය වෙනුවට සාමූහිකව සංවිධානයවී ගොවිතැන් බත් කිරීමය. ගොවි තැනට අවශ්‍ය ජලය, පොහොර, ණය වැනි යෙදවුම් සපයා ගැනීම, ගොවි නිෂ්පාදන ද්‍රව්‍ය අලෙවි කිරීම ආදී කටයුතුවලදී මෙවැනි සංවිධානාත්මක ක්‍රමයකින් දූනට වඩා විපුල එල ප්‍රයෝජන අත්වනු ඇතැයි විශ්වාස කරනු ලැබේ.

ගොවීන්ගේ පහසුව තකා ගොවි ජන සේවා මධ්‍යස්ථාන හා සම්බන්ධ සෙසු දෙපාර්තමේන්තු, ආයතන ආදිය අතුරෙන් ග්‍රාමීය බැංකුව, කෘෂිකර්ම වාරි මාර්ග, අලෙවි සංවර්ධන වැනි දෙපාර්තමේන්තු, සමූපකාරය, කෘෂි රක්ෂණ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය, කෘෂිකර්ම සංවර්ධන අධිකාරිය, පශු වෛද්‍ය අංශය ආදිය ප්‍රධාන තැනක් ගනී. කෘෂිකර්මයට අවශ්‍ය උපදෙස් හා සේවාවන්ද, කෘෂිකාර්මික ණය ද, පෝර, ගොවි උපකරණ, කෘෂි රසායනික ද්‍රව්‍ය ආදිය ද ලබා ගැනීමට මෙන් ම ගොවි ද්‍රව්‍ය අලෙවි කර ගැනීම සඳහා ද ගොවි ජන සේවා මධ්‍යස්ථානයෙන් ගොවීන්ට පහසුකම් සලසා දී ඇත.